සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk



| නිකුත් කළේ | ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව |
| --- | --- |
| දිනය | 2023 ඔක්තෝබර් 27 |

# ශ්‍රී ලංකා මහ බැංකුව - ආසියානු සංවර්ධන බැංකු ආයතනය - ආසියා ශාන්තිකර ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමය ඒකාබද්ධව සිදුකළ සිවුවන පර්යේෂණ වැඩමුළුව සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සමසත්කාරකත්වය දැරීය

ශ්‍රී ලංකා මහ බැංකුව-ආසියානු සංවර්ධන බැංකු ආයතනය-ආසියා ශාන්තිකර ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමයෙහි ඒකාබද්ධ පර්යේෂණ වැඩමුළුව 2023 වසරේ ඔක්තෝබර් මස 27 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුවේ ජෝන් එක්ස්ටර් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේදී පැවැත්විණි. අඛණ්ඩව සිවුවන වසරටත් ශ්‍රී ලංකා මහ බැංකුව සමසත්කාරීත්වය දරමින් පැවති මෙම පර්යේෂණ වැඩමුලුවෙහි සමදායකත්වය ආසියානු සංවර්ධන බැංකු ආයතනය (Asian Development Bank Institute-ADBI) සහ ආසියා ශාන්තිකර ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමය (Asia-Pacific Applied Economics Association-APAEA) මගින් දරන ලදී. මෙම පර්යේෂණ වැඩමුළුව 'ආසියා සහ පැසිෆික් කලාපයේ මුදල් ප්‍රතිපත්ති සහ මහ බැංකු ගැටලු' යන තේමාව යටතේ පැවැත්විණි.

ගෝලීය වශයෙන් ආර්ථිකයන් මුහුණ දෙන තීරණාත්මක අභියෝග කිහිපයක් ම පෙන්වා දෙමින් මෙම පර්යේෂණ වැඩමුලුවෙහි සමාරම්භක දේශනය ශ්‍රී ලංකා මහ බැංකු අධිපති ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා විසින් සිදුකරන ලදී. එම අභියෝග ලෙස මන්දගාමීව සහ අසමාන ලෙස ගෝලීය ආර්ථිකයන් යථා තත්ත්වයට පත්වීම, ඉහළ උද්ධමනය සහ භූ දේශපාලනික ගැටලු සඳහන් කරන ලදී. මහ බැංකු සිය ආර්ථික ස්ථාවර කිරීමේ කාර්යයට ප්‍රමුඛත්වය ලබා දී ක්‍රියා කිරීමේදී මෙම අභියෝග මගින් බලපෑම් ඇති කරනු ලබයි. සමස්ත සාර්ව ආර්ථික ස්ථායීතාවය ළඟා කරගන්නා අතර ම ආර්ථික වර්ධන ක්‍රියාවලිය සිදු කිරීමේදී දියුණු සහ නැගී එන වෙළඳපොළ ආර්ථික මුහුණ දී ඇති ගැටලු ද ඔහු සිය දේශනයේදී අවධාරණය කළේය. මීට අමතරව, වර්තමානයේ ගෝලීය වශයෙන් පවතින ඉහළ අස්ථාවරත්වය මධ්‍යයේ ආර්ථික මුහුණ දෙන විවිධ ගැටලුවලට පිළියම් සෙවීම සඳහා විද්වතුන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් අතර පර්යේෂණ සහයෝගීතාවය ඉහළ නැංවීමේ වැදගත්කම ද ඔහු මෙහිදී අවධාරණය කළේය. ආසියානු සංවර්ධන බැංකු ආයතනයේ පීඨාධිපති සහ ප්‍රධාන විධායක නිලධාරී මහාචාර්ය ටෙට්සුෂි සොනොබෙ මහතා මෙම වැඩමුලුවෙහි ආරම්භක අදහස් දැක්වීම සිදු කළ අතර මූල්‍ය පද්ධතියේ ස්ථායීතා ගැටලු මගින් තවදුරටත් උග්‍රවන බහුවිධ අර්බුද සහිත කාලවලදී නැගී එන වෙළඳපොළ ආර්ථික තුළ මුදල් ප්‍රතිපත්ති මෙහෙයවීම කෙතරම් අභියෝගාත්මකවනු ඇතිද යන්න පෙන්වා දෙන ලදී. මෙවැනි පර්යේෂණ වැඩමුළු විද්වතුන් සහ ප්‍රතිපත්ති සම්පාදකයින් අතර සංවාදයක් ඇති කිරීමට සහ මුදල් ප්‍රතිපත්තියට අදාළ පර්යේෂණ තවදුරටත් වර්ධනය කිරීමට සහායවන බව ඔහු අවධාරණය කළේය. ආසියා ශාන්තිකර ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමයේ සභාපති මහාචාර්ය පරේෂ් නාරායන් මහතා මෙම වැඩමුළුව නිමා කිරීමේ දේශනයේදී සිය අදහස් දක්වමින්, නැගී එන වෙළඳපොළ ආර්ථික මත මුදල් ප්‍රතිපත්ති බලපෑම් පිළිබඳව සිදු කරනු ලබන පර්යේෂණවල වැදගත්කම පෙන්වා දෙන ලදී. ප්‍රතිපත්ති මත පදනම් වූ පර්යේෂණ ප්‍රවර්ධනය කිරීමේදී මෙවැනි පර්යේෂණ සහයෝගීතා අත්‍යවශ්‍ය බවද ඔහු මෙහිදී අවධාරණය කළේය.

සැසි තුනකින් සමන්විතවූ මෙම වැඩමුලුවෙහිදී ශ්‍රී ලංකා මහ බැංකුවේ පර්යේෂකයන් සහ ආසියා සහ පැසිෆික් කලාපයේ රටවල් කිහිපයක පර්යේෂකයන්ගේ පර්යේෂණ පත්‍රිකා ඉදිරිපත් කරන ලදී. ආසියානු සංවර්ධන බැංකු ආයතනයෙහි පර්යේෂණ අංශයේ උප සභාපති ආචාර්ය ජෝන් බියර්න් මහතා, ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ටී. එම්. ජේ. වයි. පී. ප්‍රනාන්දු මිය සහ නියෝජ්‍ය අධිපති කේ. එම්. ඒ. එන්. දවුලගල මිය මෙම සැසිවාරයන්හි මුලසුන හෙබවූහ.




*ඉදිරිපෙළ වමේ සිට පිළිවෙළින්:* ආචාර්ය එල්. ආර්. සී. පත්බේරිය මහතා (අතිරේක අධ්‍යක්ෂ ආර්ථික පර්යේෂණ), ආචාර්ය පී. කේ. ජී හරිස්චන්ද්‍ර මහතා (අධ්‍යක්ෂ ආර්ථික පර්යේෂණ), කේ. එම්. ඒ. එන්. දවුලගල මිය (නියෝජ්‍ය අධිපති), මහාචාර්ය පරේෂ් නාරායන් මහතා (ආසියා ශාන්තිකර ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමයේ සභාපති), ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ මහතා (අධිපති), මහාචාර්ය ටෙට්සුෂි සොනොබෙ මහතා (ආසියානු සංවර්ධන බැංකු ආයතනයේ පීඨාධිපති සහ ප්‍රධාන විධායක නිලධාරී), ආචාර්ය ජෝන් බියර්න් මහතා (ආසියානු සංවර්ධන බැංකු ආයතනයේ පර්යේෂණ අංශයේ උප සභාපති), ටී. එම්. ජේ. වයි. පී. ප්‍රනාන්දු මිය (ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති), ඒ. ආර්. කේ. විජේසේකර මහතා (සහකාර අධිපති) සහ ආචාර්ය එස්. ජෙගජීවන් මිය (අතිරේක අධ්‍යක්ෂ ආර්ථික පර්යේෂණ).

*පසුපෙළ වමේ සිට පිළිවෙළින්:* ආචාර්ය එම්. එම්. ජේ. ඩී. මහීපාල මහතා (ශ්‍රී ලංකා මහ බැංකුව), සූසන් සුනිලා ශර්මා මෙනවිය (සහායක මහාචාර්ය, ඩීකින් විශ්ව විද්‍යාලය), ආචාර්ය භවේෂ් ගාර්ග් මහතා (සහායක මහාචාර්ය, ඉන්දියානු තාක්ෂණ ආයතනය - රෝපාර්, ඉන්දියානු සහ ආසියා ශාන්තිකර ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමය), මහාචාර්ය එස්. රාජා සේතු දුරායි මහතා (මහාචාර්ය, හයිද්‍රාබාද් විශ්ව විද්‍යාලය), ආචාර්ය කේ. පී. ප්‍රභීෂ් මහතා (සහායක මහාචාර්ය, ඉන්දියානු තාක්ෂණ ආයතනය), මහාචාර්ය විග්නේස්වර ස්වාමි මහතා (මහාචාර්ය සහ පර්යේෂණ අංශයේ පීඨාධිපති, ICFAI උසස් අධ්‍යාපන පදනම), ආචාර්ය නුම්බු රෙන්සි මහතා (සහායක මහාචාර්ය, ආර්ථික හා ව්‍යාපාර පිළිබඳ කැපිටල් විශ්ව විද්‍යාලය), ආචාර්ය ආර්. ඩී. තිළිණි සුමුදු කුමාරි මෙනවිය (ශ්‍රී ලංකා මහ බැංකුව), තේජා පත්බේරිය මිය (ශ්‍රී ලංකා මහ බැංකුව) සහ චමීලි ගුණවර්ධන මිය (ශ්‍රී ලංකා මහ බැංකුව).